# <u>නිවේදනය</u> C

e-chamber හෙවත් සභාගර්භ කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතිය මඟින් සෑම ගරු මන්ත්‍රීවරයකුගේම මේසය මතට පරිගණකයක් ලබාදී ඇත.

ගරු මන්ත්‍රීවරුන් විසින් පාර්ලිමේන්තුවේ, විශේෂයෙන්ම සභා ගර්භය තුලදී සිදුකරන කටයුතු තවදුරටත් කාර්යක්ෂමව හා ඵලදායි අයුරින් සිදුකිරිමට සහායවීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

දැනට ගරු මන්ත්‍රීවරුන් වෙත ලබාදී ඇති පරිශීලක නාමය හා මුරපදය (Username and Password) භාවිතා කර අදාළ පරිගණක පද්ධතිය වෙත ප්‍රවේශ විය හැකිය.

සියළු පරිගණක කියොස්ක් (KIOSK) ආකාරයෙන් ස්ථාපනය කර ඇති අතර, මෙමඟින් ගරු මන්ත්‍රීවරුන්ගේ කටයුතු කාර්යක්ෂමව කරගැනීමට ඇවැසි තොරතුරු මෙන්ම අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් සේවාවන් ලබාගැනීමේ පහසුකම් ද සැපයෙන අතර මෙතෙක් සභාගර්භය තුල ස්ථාපිතව පැවැති වයි ෆයි (Wi-Fi) මාධ්‍යයෙන් මෙම පරිගණක ජාලගත කර ඇත.

රජයේ මුල්‍ය පිරිවැයක් දැරීමෙන් තොරව ක්‍රියාත්මක කළ මෙම ව්‍යාපෘතියේ පරිගණක විදේශ ආධාරයක් වන අතර, අවශ්‍ය මෘදුකාංග පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සකසා ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් ගරු මන්ත්‍රීවරුන්ට පහත දැක්වෙන සේවාවන් ලබාගත හැකිය.

- ව්‍යවස්ථාදායක තෙ‍ාරතුරු -
  - තමන් විසින් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් හා පෙත්සම් යනාදිය පිළිබඳ තොරතුරු
  - තමන් විසින් අසන ලද ප්‍රශ්න හා ඒවාට ලබාදුන් පිළිතුරු
  - ඉදිරියේදී ඇසීමට නියමිත ප්‍රශ්න හා ඒවාට වෙන්කර ඇති දින
- පෞද්ගලික තොරතුරු -
  - වැටුප් විස්තර, පැමිණීමේ විස්තර යනාදිය
- නියමිත දිනට අදාළ තොරතුරු -
  - පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය, දිනට නියමිත වැඩ පිළිවෙල, න්‍යාය පුස්තක, පරිපූරක යනාදිය
  - කාරක සභා වාර්තා පිළිගැන්වීම, වෙනත් රජයේ වාර්තා හා ගැසට් පත්‍ර ඉදිරිපත්කිරීම යනාදිය
  - දිනට පැවැත්වෙන කාරක සභා රැස්වීම් වැඩසටහන හා වේලාවන්
- පසුගිය තොරතුරු -
  - හැන්සාඩ් වාර්තා, කාරක සභා වාර්තා යනාදිය

- මෙයට අමතරව, අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් සේවා පහසුකම්ද, තවත් විවිධ තොරතුරුද ගරු මන්ත්‍රීතුමන්ලාගේ ආසනයේ සිටම ලබාගත හැකිය.

මෙම පද්ධතිය සම්බන්ධයෙන් උපදෙස් මාලාවක් දැනටමත් සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ මේස මත තබා ඇත. වැඩිවිස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන දිගුව 6581 ඔස්සේ පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කවුළු සම්බන්ධීකාරක අමතා ලබාගත හැකිය.

එසේම, මෙම පද්ධතිය පරිහරණය කිරිම පිළිබඳ වැඩිපුර පුහුණුවක් අවශ්‍ය වන්නේ නම්, පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් ලබාදිය හැක.

පාර්ලිමේන්තුවට ලබාදෙන ලද මෙම පරිගණක ඔබ සැමගේ පෞද්ගලික වස්තුවක් ලෙස සැලකිල්ලෙන් හා ආරක්ෂාවෙන් යුතුව පරිහරණය කරමින්, බොහෝ කාලයක් මෙම පරිගණක හොඳින් පවත්වාගෙන යාම සඳහා ඔබතුමන්ලාගේ පූර්ණ සහාය ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙම ව්‍යාපෘතිය මඟින් සැපයෙන සේවා ඔබගේ පාර්ලිමේන්තු කටයුතු තවදුරටත් පහසුවෙන් හා ඵලදායි අයුරින් සිදුකර ගැනීමට ඉවහල්වනු ඇතැයි මම විශ්වාස කරමි.